# කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2018

**10 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය - II** කාලය පැය 2 යි;

නම: .......................................................................... . විභාග අංකය: ................

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

1) පාලන ක්‍රමයක් ලෙස ඍජු ප්‍රජාතන්ත්‍ර වාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළු දෙකක් ලියන්න.

2) නියෝජිතයන් තෝරා පත්කර ගැනීම සඳහා වර්තමානයේදී බහුල වශයෙන් අනුගමනය කරනු ලබන නියෝජන ක්‍රම දෙකක් නම් කරන්න.

3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ඇතුළත් විය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

4) නීතියේ ආධිපත්‍ය පවතින බව විදහාපාන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

5) ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

6) ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික සංකල්ප දෙකක් ලියන්න.

7) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියා හා බැඳුණු නීතිමය යුතුකම් දෙකක් සඳහන් කරන්න.

8) සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න.

9) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන දෙකක් නම් කරන්න.

10) බලය යන සංකල්පයේ ස්වරූප දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 10 x 2)

2)
- i. ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු සතුවිය යුතු ගුණාංග දෙකක් සඳහන් කරන්න.(ලකුණු 2)
- ii. ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයන්ට ඡන්දය පාවිච්චි කිරීමට ලැබෙන අවස්ථා තුනක් ලියන්න. (ලකුණු 3)
- iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සාර්ථක කර ගැනීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යභාරය කරුණු තුනක් ඇසුරින් ලියන්න. (ලකුණු 5)

3)
- i. තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 2)
- ii. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 3)
- iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන කටයුතු පවත්වාගෙන යාමේදී ජන සමාජයට ආණ්ඩුවෙන් ඉටුවිය යුතු වගකීම් තුනක් විස්තර කරන්න. (ලකුණු 5)

4)
- i. රාජ්‍යයක් තුළ දක්නට ලැබෙන ප්‍රධාන අංග දෙකක් ලියන්න. (ලකුණු 2)
- ii. එංගලන්තය, ප්‍රංශය වැනි රටවල් ප්‍රබල ජාතික රාජ්‍ය ලෙස නැගී සිටීම හේතු වූ කරුණු තුනක් ලියන්න. (ලකුණු 3)
- iii. රාජ්‍යයක පැවරෙන කාර්යයන් නිදසුන් තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

5) i. බහු සංස්කෘතික ජන සමාජයක මූලික ලක්‍ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

ii. බහු සංස්කෘතික ජනසාමජයක් බිහිවීම කෙරෙහි බලපාන සාධක තුනක් ලියන්න. (ලකුණු 3)

iii. රටක ආර්ථික සංවර්ධනය මන්දගාමී වීමට හා සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන කරුණු තුනක් විස්තර කරන්න. (ලකුණු 5)

6) i. යහපාලනයක මූලික ගුණාංග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

ii. බහු සංස්කෘතික ජන සමාජයක යහ පාලනය ක්‍රියාත්මක වීමෙන් උදාකර ගත හැකි යහපත් ප්‍රතිඵල තුනක් ලියන්න. (ලකුණු 3)

iii. බහු සංස්කෘතික සමාජයක යහ පැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග තුනක් විස්තර කරන්න. (ලකුණු 5)

7) i. ඒකීය රාජ්‍යයක ලක්‍ෂණ දෙකක් ලියන්න. (ලකුණු 2)

ii. නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

iii. ස්විට්සර්ලන්තය සන්ධීය රාජ්‍යයක් ලෙස ගොඩනැගීමට බලපා ඇති හේතු තුනක් විස්තර කරන්න. (ලකුණු 5)